**මාර්ග සංවර්ධන අධිකාරිය - 2015**

**----------------------------------**

මාර්ග සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනතේ 16 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මාර්ග සංවර්ධන අධිකාරියට සම්පූර්ණ අයිතිය ඇති පරිපාලිත සමාගම් වන මග නැගුම කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉක්විප්මන්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්, මග නැගුම කන්සල්ටන්සි ඇන්ඩ් ප්‍රෝජෙක්ට් මැනේජ්මන්ට් සර්විස් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඉමල්ෂන් ප්‍රඩක්ෂන් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පොර්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම්වල විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබා ගෙන නොතිබුණි.

තවද සමාලෝචිත වර්ෂය තුළ පරිපාලිත සමාගම් සමඟ රු. බිලියන 1.9 ක් වටිනාකමැති ගණුදෙනු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකර තිබුණද, එම ගණුදෙනු පිළිබඳ තොරතුරු සහ නොගෙවූ ශේෂයන් පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුව මූල්‍ය වාර්තාවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.රා.ශ්‍රී.ප්‍ර) සමඟ අනුකූල වීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

#### (අ) ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 1- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

(i) ගණුදෙනු හා සිද්ධි ඒවා සිදුවන අවස්ථාවේදී හඳුනාගෙන ඒවාට අදාළ කාලපරිච්ඡේදයට වාර්තාකල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී දේශීය බැංකු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියට අදාළ අන්තර් ගෙවීම් සහතික සඳහා කරන ලද එකතුව රු.මිලියන 104,004 ක් වූ ගෙවීම් විලම්භිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, දේශීය බැංකු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද එහෙත් මුදල් ගෙවා නොමැති රු.මිලියන 255.42 ක් වූ අන්තර් ගෙවීම් සහතික 2015 දෙසැම්බර් 31 වන විට උපචිත පදනම මත ගිණුම්ගත කර නොතිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂය අවසානයේ දී උපචිත වියදම් එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) වාර්තා කරන දිනෙන් පසුව මාස 12 ක් තුළදී ලැබීමක් උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන විට හෝ වගකීමක් නිරවුල් කිරීමට නියමිත නම්, එය ජංගම වත්කම් හෝ වගකීම් ලෙස වර්ගීකරණය කළ යුතුය. ඒ අනුව, 2016 වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන බිල්පත්වලින් අයකර ගතයුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ප්‍රමාණය හඳුනාගෙන ජංගම වත්කම් ලෙස දැක්විය යුතුය. කෙසේ වුවද, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගතයුතු කාලපරිච්ඡේදය පිළිබඳ සැළකිල්ලට නොගෙන සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාල සහ ගෙවීම් අංශයට ලබාදුන් එකතුව රු. 59,598,529 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ජංගම වත්කම් ලෙස සළකා තිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂවලදී එම අංශවලට ලබාදුන් එකතුව රු. 12,237,389 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් ලෙස දක්වා තිබුණි.

(iii) නිරවුල් කළයුතු නියමිත දින වකවානු පිළිබඳ හඳුනා ගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවාගත් මුදල් ජංගම සහ ජංගම නොවන වගකීම් යටතේ පිළිවෙලින් රු. 4,858,982,805 ක් හා රු. 3,331,018,091 ක් ලෙස වර්ගීකරණය කර තිබුණි.

**(ආ) ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර.3 - ගිණුම් ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි.**

දේශිය බැංකු ණය මුදල් ව්‍යාපෘතියේ මාර්ග ඉදිකිරීම් වලට අදාළව කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවන ලද අගය විලම්බිත වියදම් ලෙස ජංගම නොවන වත්කම් යටතේ දක්වන අතර, බැංකු මඟින් ලබාගත් ණය මුදලින් වර්ෂය තුළ බැංකුව වෙත ආපසු ගෙවන අගය විලම්බිත වියදම් වලින් අඩුකර ප්‍රවර්ථන වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි. මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 7 - දේපල, පිරියත හා උපකරණ**

(i) සෑම වාර්ෂික වාර්තාකරණ දිනකදීම හෝ වත්කමක ධාරණ අගය සහ ඵලදායී ජීව කාලය සමාලෝචනය කළ යුතු වුවද, අධිකාරිය විසින් තවදුරටත් භාවිතා කරන රු. මිලියන 972 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවකාලය සමාලෝචනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) සාමාන්‍යයෙන් අධිකාරියේ ස්ථාවර වත්කම්, මිලදී ගත් දිනයේ සිට ඉවත් කරන දිනය දක්වා ක්ෂය සිදු නොකරයි. වත්කම් අත්පත් කරගත් මාසයට පසු මාසයේ සිට ක්ෂය කරන අතර වත්කම් ඉවත් කරන මුළු මාසය සඳහාම ක්ෂය කරනු ලබන බවට නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේශිය බැංකු අරමුදල් ව්‍යාපෘතියට අදාළ මාර්ග පුනරුත්ථාපනය කරනු ලබන ව්‍යාපෘති විසින් 2013 – 2015 වර්ෂවල ප්‍රසම්පාදනය කරන ලද රු.මිලියන 507 ක් වූ ස්ථාවර වත්කම් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ස්ථාවර වත්කම්වල වටිනාකම එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබුණු අතර ඒ සඳහා ක්ෂය රු. මිලියන 219.51 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා වූ විදේශ මූල්‍යයන ව්‍යාපෘති 05 ක් විසින් ප්‍රසම්පාදනය කළ රු. 69,800,000 ක් වටිනා මෝටර් වාහනවල හිමිකාරිත්වය සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය වෙත පවරා තිබුණි. කෙසේ වුවද, එම මෝටර් රථවල අගය ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) (i) ස්ථාවර වත්කම් අපහරණයෙන් ලද රු.11,981,954 ක් වූ විකුණුම් මුදල්, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ආදායම් ලෙස දක්වා තිබුණද එම වත්කම්වල පිරිවැය අධිකාරිය විසින් අත්පත් කරගත් දිනයේ සිට ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ii) රු. 15,050,000 ක් වූ ගොඩනැගිලි 2015 වර්ෂයේ ක්ෂය කර නොතිබුණ අතර, ඒ අනුව 2015 වර්ෂයට අදාළ රු. 752,500 ක් වූ ක්ෂය පිරිවැය අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

---------------------------------

පහත සඳහන් පැහැදිලි නොකළ වෙනස්කම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුම් 46 කට අදාළ රු. 120,935,788,038 ක් වූ මුළු එකතු ණය ශේෂය අදාළ බැංකු විසින් සනාථ කරන ලද රු. 116,537,540,890 ක් වූ මුළු එකතු ශේෂයන් සමඟ එකඟ නොවීය.

(ආ) දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිරිවැය රු.මිලියන 114,166 ක අගයක් විය. කෙසේ වුවද, මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අධිවේගී මාර්ගවල අනුරූපී පිරිවැය රු.මිලියන 114,071 ක් විය.

(ඇ) පරිපාලිත සමාගම් වෙතින් ලැබිය යුතු / ගෙවිය යුතු ශේෂයන් සහ එම ලැබිය යුතු / ගෙවිය යුතු වලට අදාළ පරිපාලිත සමාගම් විසින් ඉදිරිපත්කළ සනාථ කිරීම් අතර රු. 635,840,889 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

රාජ්‍ය ආයතන මෙන්ම පුද්ගලික පාර්ශවයන්ගෙන් අයවිය යුතු මුදල් අයකරගැනීම සඳහා අධිකාරිය විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එයට අමතරව, ගෙවිය යුතු අගයන් තුළ ඇතුලත් බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු අගයන් අධිකාරිය විසින් නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) ලැබිය යුතු ගිණුම්

| | විස්තරය | මුදල (රු.) | ගනුදෙනුකරු පිළිබඳ විස්තර | අයනොවූ කාලපරිච්ඡේදය / වර්ෂ |
|---|---|---|---|---|
| (i) | ණයගැතියෝ | 7,368,162,377 | ණයගැති ගිණුම් - 16 | 2012 සිට 2014 දක්වා සහ 1987 සිට 2014 දක්වා |
| (ii) | සේවා සහ කුලී අත්තිකාරම් | 7,405,680 | රාජ්‍ය ආයතන හා පුද්ගලයින් - 08 | 2001 - 2014 |
| (iii) | කුලී අත්තිකාරම් | 6,494,948 | තැන්පතු - 18 | 2008 – 2014 |
| (iv) | කොන්ත්‍රාත් අත්තිකාරම් | 27,402,432 | කොන්ත්‍රාත්කරුවන් - 28 | 2005- 2014 සහ වර්ෂ 08 ඉක්ම වූ |
| (v) | අනිකුත් අත්තිකාරම් | 3,740,000,000 | මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 2014 සිට 2015 දක්වා |
| (vi) | ණය කොන්දේසි අත්තිකාරම් | 11,478,909 | මගනැගුම මාර්ග ඉදිකිරීම් සහ යන්ත්‍රෝපකරණ (පුද්ගලික) සමාගම. | 2013 සිට 2015 දක්වා |
| | | 71,100,621 | කොන්ත්‍රාත්කරුවන් - 05 | 2013 සිට 2015 දක්වා |
| (vii) | වැඩ පූර්ව අත්තිකාරම් | 2,000,000,000 | ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය | 2014 සිට 2015 දක්වා |
| | | 1,119,966,845 | කොන්ත්‍රාත්කරුවන් - 34 | 2001 සිට 2015 දක්වා |
| (viii) | මිළදී ගැනුම් අත්තිකාරම් | 33,631,574 | සැපයුම්කරුවන් - 92 | 2011 සිට 2015 දක්වා සහ වර්ෂ 05 ඉක්ම වූ |
| (ix) | ලැබිය යුතු කුලී | 1,781,623 | බොරැල්ල උමං මාර්ගයේ සාප්පු හිමිකරුවන් - 02 | වර්ෂ 05 සිට වර්ෂ 08 දක්වා |
| | | 1,109,689 | මහනුවර උමං මාර්ගයේ සාප්පු හිමිකරුවන් - 05 | වර්ෂ 03 සිට වර්ෂ 04 දක්වා |
| (x) | අයකර නොමැති වැටුප් සහ අනිකුත් දිමනා | 62,004,844 | මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය - 260 | වර්ෂ 01 |
| | | 62,757,658 | මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය - 94 | වර්ෂ 02 |
| | | 1,718,292 | අමාත්‍යාංශ 07 කට නිදහස් කළ කාර්ය මණ්ඩලය | 2013 සිට 2015 දක්වා |
| (xi) | අයනොවූ සේවක ණය | 3,104,786 | මාර්ග සංවර්ධන අධිකාරියේ විශ්‍රාමික කාර්ය මණ්ඩලය - 50 | වර්ෂ 01 සිට වර්ෂ 12 දක්වා |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| | විස්තරය | මුදල (රු.) | ගණුදෙනුකරුවන් පිළිබඳ විස්තර | නිරවුල් නොකළ කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| (i) | සේවාදායක තැන්පතු | 494,608,295 | සේවාදායක වැඩ - 200 | වර්ෂ 1 සිට වර්ෂ 7 දක්වා |
| | | 227,865,985 | සේවාදායකයින් - 119 | 2010 සිට 2014 දක්වා |
| (ii) | ආරක්ෂක තැන්පතු | 2,278,159 | කොන්ත්‍රාත්කරුවන් - 111 | වර්ෂ 29 ට වැඩි |
| (iii) | ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් | 973,394,696 | කොන්ත්‍රාත් - 1073 | වර්ෂ 03 සිට වර්ෂ 10 දක්වා සහ වර්ෂ 10 ට වැඩි |
| (iv) | ගෙවිය යුතු ව්‍යාපෘති සහ අනිකුත් කොන්ත්‍රාත්කරුවෝ | | | |
| | - අසම්පූර්ණ වූ බිල් | 205,861,302 | කොන්ත්‍රාත් - 28 | වර්ෂ 01 ට අඩු |
| | - අනුමත නොවූ විචලනයන් | 135,099,370 | කොන්ත්‍රාත් - 27 | |
| (v) | ගෙවිය යුතු කොන්ත්‍රාත්කරුවන් | 328,923,378 | කොන්ත්‍රාත්කරුවන් - 06 | වර්ෂ 01 ට අඩු |
| (vi) | ආදායමට මාරු නොකළ ප්‍රමාද ගාස්තු | 676,846,546 | කොන්ත්‍රාත් - 450 | 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා |

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම

මුළු ඒකක ප්‍රමාණය, ඒකක මිල සහ මුළු වටිනාකම ඇතුළත් විස්තරාත්මක උපලේඛන ආදී සාක්ෂි නොමැති වීම හේතුවෙන් එකතුව රු. 552,044,028 ක් වූ උපකරණ, ඍජු අමුද්‍රව්‍ය, වක්‍ර අමුද්‍රව්‍ය, අමතර කොටස්, ලිපිද්‍රව්‍ය, මුද්‍රණ අයිතමයන් ආදී ඉන්වෙන්ට්‍රි අයිතමයන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 2.3 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 373 හා 2015 ඔක්තෝබර් 21 දිනැති අංක 336 දරණ කාර්යාල චක්‍රලේඛය | අධිකාරියේ උප කාර්යාල 02 කට හා අංශ 03 කට ලබා දෙන ලද එකතුව රු.31,651,973 ක් වූ සුළු මුදල් අග්‍රිම හා ඉන්ධන අග්‍රිම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 | නිකුත් කරන ලද එහෙත් මාස 06 කට වැඩි කාලයක උපලබ්ධි නොවූ රු. 3,903,709 ක් අගය ඇති චෙක්පත් 67 ක් අවලංගු කිරීමට අධිකාරිය විසින් කාලීනව පියවර ගෙන නොතිබුණි. |
| **(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.** | |
| (i) 9:4 වගන්තිය | චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට පටහැනිව අධිකාරියේ කාර්ය මණ්ඩලය 260 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණි. |
| (ii) 9:3:1(viii) වගන්තිය | අධිකාරිය විසින් කළමනාකරණ මට්ටමේ තනතුරු පුරප්පාඩු ආවරණය කිරීම සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් පිළියෙල කර නොතිබුණි |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 1,674.93 ක බදු පූර්ව ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා රු.මිලියන 4,962.68 ක බදු පූර්ව ශුද්ධ ඌනතාවයක් වූ හෙයින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 6,637.61 ක වැඩිවීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වැඩිවීම සඳහා රු. මිලියන 12,506 කින් මුළු ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් වියදම රු.මිලියන 5,868.47 කින් වැඩි වී තිබුණි. මේ අතර දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් සමඟ මාර්ග පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම් ණය සඳහා පොළිය වැඩි වී තිබුණි.

**3.2 අධිකාරිය විසින් එකතු කළ අගය**

සපයන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ එකතු කළ අගය රු.මිලියන 21,307 ක් වූ අතර ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 45 කින් වැඩි වීමකි. කෙසේ වුවද, මෙම වැඩිදියුණුව සඳහා ප්‍රධාන වශයෙන් රජයේ දායකත්වයන් සහ රු.මිලියන 1,016 කින් අධිවේගී මාර්ග ආදායම වැඩි වීම (රාජ්‍ය ආයෝජන මඟින් ඉපයීම) බලපා ඇති අතර අධිකාරිය විසින් ස්වයං එකතු කළ අගයක් නොවීය. එමෙන්ම, ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ රජයේ දායකත්වයන් සහ අනුග්‍රහයන් සැලකිය යුතු පරිදි වැඩි වී ඇතත් මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම, නව මාර්ග ඉදි කිරීම ආදී අධිකාරියේ ප්‍රධාන කටයුතුවල දියුණුවක් නොවීය.

**3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන සැලකිය යුතු ශේෂයන් කිහිපයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනට 2015 රු.මිලියන | 2014 රු.මිලියන |
|---|---|---|
| ශුද්ධ ජංගම වත්කම් | (855.55) | 2,717 |
| ශුද්ධ වත්කම් | 161,409 | 170,633 |
| සමුච්චිත ඌනතාවය | (12,740) | (13,576) |

අධිකාරියේ සමුච්චිත ඌනතාවය ඉකුත් වර්ෂයේ රු.මිලියන 13,576 සිට සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 12,740 දක්වා අඩු වී ඇතත්, ශුද්ධ ජංගම වත්කම් සහ ශුද්ධ වත්කම් පිළිවෙලින් රු.මිලියන 3,572.55 කින් එනම් සියයට 131 කින් සහ රු.මිලියන 9,224 කින් එනම් සියයට 05 කින් අඩුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 ජාතික මාර්ග හා පාලම්වල නඩත්තු වැඩ**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජාතික මාර්ග නඩත්තු කටයුතු සඳහා රු. මිලියන 4,994.78 ක මුදලක් වෙන්කර තිබුණද එම මුළු වෙන් කිරීම් වලින් රු. මිලියන 1,996.81 ක මුදලක් එනම් සියයට 39.97 ක් පමණක් භාවිතයට ගෙන තිබුණි.

(ii) විධායක ඉංජිනේරු කාර්යාල 06 ක් මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති 23 ක් යටතේ ආවරණය වන මාර්ග නඩත්තු කටයුතු රු.මිලියන 161.37 ක පිරිවැයකට 2015 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපේක්ෂිත විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළදී එම කටයුතු නිමකර නොතිබූ අතර, 2015 දෙසැම්බර් 31 දක්වා දරන ලද සත්‍ය පිරිවැය රු.මිලියන 27.91 ක් පමණක් විය.

(ii) කාලීන නඩත්තු කිරීම, ජලකාණු හා ව්‍යුහ වැඩිදියුණු කිරීම, සංඥා ලාම්පු පද්ධති, වීදි ලාම්පු, මාර්ග සංඥා හා සලකුණු කිරීම් නඩත්තු කිරීම සහ සුළු මාර්ග ආරක්ෂණ වැඩිදියුණු කිරීම් සහ හදිසි නඩත්තු කිරීම්/ ආපදා වැඩ සඳහා වෙන්කල අරමුදල් භාවිතා කිරීම සියයට 50 ට වඩා අඩු විය. එහි ප්‍රතිඵලක් ලෙස ජාතික මාර්ග ජාලයේ නඩත්තු කටයුතුවල ප්‍රමිතගත තත්ත්වය වෙන් කරන ලද ප්‍රතිපාදන ඌන උපයෝජනය මඟින් බලපා තිබුණි.

### 4.1.2 ඉංජිනේරු සේවා හා පාලම් සැලසුම් අංශයේ කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 වර්ෂය සඳහා මෙම අංශයේ වැඩ සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම සැලැස්ම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ පාලම් 69 ක් සැලසුම් කිරීමට බලාපොරොත්තු වී තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවට අනුව පාලම් 39 කට අදාළ සැලසුම් පමණක් අවසන් කර තිබුණි.

(iii) අධිකාරියේ විෂය පථයට අයත් නොවුවද ආරක්ෂක මූලස්ථානයට පිවිසුම් මාර්ගයේ ඇති පාලම් සහ මරියන් ඩ්‍රයිව් දිගුවෙහි (Marine Drive extension) දෙහිවල ඇළ මාර්ගය හරහා ඇති පාලම, අධිකාරියේ පාලම් සැලසුම් අංශය මඟින් නිර්මාණය කර තිබුණි.

## 4.2 කොන්ත්‍රාත් පරිපාලනය

### 4.2.1 මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම

සමාලෝචිත වර්ෂයේ මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ වැඩ ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම.

(i) ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන 25,103 ක් වූ මාර්ග වැඩි දියුණු කිරීමේ වැඩ ව්‍යාපෘතීන් 259 ක වැඩ නිම කිරීමට බලාපොරොත්තු වී තිබුණි. කෙසේ වුවද, මෙම ක්‍රියාකාරකම්වල 2015 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 50 කට අඩු විය. එයින් ව්‍යාපෘති 206 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන (Non RDA) මාර්ග වලට අදාල ව්‍යාපෘතීන් වූ අතර එහි ඇස්තමේන්තුගත වටිනාකම සහ ඒ සඳහා වැයකළ පිරිවැය පිළිවෙලින් රු. මිලියන 17,928 ක් සහ රු. මිලියන 913 ක් විය. සියයට 50 කට අඩු භෞතික ප්‍රගතියක් ඇති ව්‍යාපෘති 53 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් විය. එහි කොන්ත්‍රාත් පිරිවැය හා වැයකළ වටිනාකම පිළිවෙලින් රු. මිලියන 7,175 ක් සහ රු. මිලියන 581 ක් විය.

(iii) ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 4,902 ක් වූ සමාලෝචිත වර්ෂයේ නිමකළ යුතු ව්‍යාපෘතීන් 84 ක් පැවති අතර එම ව්‍යාපෘතිවල කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. කෙසේ වුවද, එයින් එක් ව්‍යාපෘතියක් සඳහා රු. මිලියන 2.50 ක් පමණක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘති 84 න් ව්‍යාපෘති 54 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග වලට අදාල ව්‍යාපෘතීන් වූ අතර එහි කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 2,465 ක් විය.

(ආ) **දේශීය බැංකු විසින් මූල්‍යයනය කෙරෙන ව්‍යාපෘති (LBFP)**

දිවයින පුරා කිලෝමීටර 1,433.85 ක දිගින් යුත් ප්‍රමුඛතා මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා දේශීය බැංකුවලින් රු.බිලියන 152 ක් වූ ණය මුදල් අධිකාරිය වෙත ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය වෙතින් අධිකාරිය ලැබී තිබුණි. ඒ අනුව මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා රු.බිලියන 152 ක් වටිනා කොන්ත්‍රාත්, අධිකාරිය විසින් ලබාදී තිබුණි.

වර්ෂ 2012 – 2015 කාලපරිච්ඡේදය තුළ දේශීය බැංකු 07 කින් එකතුව රු.මිලියන 131,441 ක් වූ ණය මුදල් අධිකාරිය විසින් ලබාගෙන තිබුණි. ඉන් රු.මිලියන 4,523 ක මුදලක් 2014 සහ 2015 වර්ෂ තුළදී නිරවුල් කර තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනට ණය මුදලේ ගෙවිය යුතු කොටස රු.මිලියන 126,918 ක් බව නිරීක්ෂණය විය. ලැබුණු ණය පිළිබඳ විස්තර හා සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ණය මුදල් කොටස පිළිබඳ විස්තර පහත දැක්වේ.

| බැංකුවේ නම | වර්ෂය සඳහා බැංකු වලින් ලැබුණු ණය | | | | එකතුව | වර්ෂය තුළ ප්‍රාග්ධනය ආපසු ගෙවීම | | එකතුව | 2015 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2015 | | 2014 | 2015 | | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| කොමර්ෂල් බැංකුව | 1,266 | 634 | 2,647 | 1,497 | 6,044 | 128 | 361 | 489 | 5,555 |
| ලංකා බැංකුව | 3,703 | 9,637 | 10,402 | 6,606 | 30,348 | 218 | 1,469 | 1,687 | 28,661 |
| මහජන බැංකුව | 3,369 | 5,234 | 4,806 | 562 | 13,971 | 607 | 1,220 | 1,827 | 12,144 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 384 | 4,953 | 43,931 | 5,076 | 54,344 | - | 339 | 339 | 54,005 |
| සංවර්ධන මූල්‍ය සංස්ථාව | 209 | 724 | * (32) | 309 | 1,210 | - | 45 | 45 | 1,165 |
| හැටන් නැෂනල් බැංකුව | - | 3,614 | 8,562 | 7,365 | 19,541 | - | 136 | 136 | 19,405 |
| ජාතික සංවර්ධන බැංකුව | - | - | 4,214 | 1,769 | 5,983 | - | - | - | 5,983 |
| එකතුව | 8,931 | 24,796 | 74,530 | 23,184 | 131,441 | 953 | 3,570 | 4,523 | 126,918 |

* 2013 වර්ෂයේදී සාවද්‍යාව බැරකර 2014 වර්ෂයේදී නිවැරදි කර ඇත.
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලබාගත හැකි වූ තොරතුරු අනුව ඉහත ව්‍යාපෘතිය (LBFP) යටතේ මාර්ග ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව තෝරාගෙන නොතිබුණි. ඒ වෙනුවට අදාළ මාර්ග 54 ක් සඳහා කොන්ත්‍රාත් යෝජනා කොන්ත්‍රාත්කරුවන් විසින්ම ලබා දී තිබුණි. ඉදිරිපත් කරන ලද යෝජනා අනුව මාර්ග 54 ක් සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.බිලියන 162 ක් වුවත් අමාත්‍ය මණ්ඩලය පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුව (CATEC) මෙම කොන්ත්‍රාත් රු.බිලියන 146.5 කට පිරිනැමීම නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද, මිල වැඩිකිරීම පිළිබඳ හේතූන් ඉදිරිපත් නොකර අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව විසින් තාක්ෂණික ඇගයීම් කමිටුව (CATEC) නිර්දේශ කළ කොන්ත්‍රාත් වටිනාකම රු.බිලියන 155.79 දක්වා වැඩි කර තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරුවන්ගේ යෝජනා තාක්ෂණික ඇගැයීම් කමිටුව (TEC) විසින් විධිමත්ව ඇගයීම් කර නොතිබුණි. තවද එක් එක් මාර්ගය ඇගයීම් කිරීම සඳහා වැඩ විෂයයන්, ප්‍රමාණයන් හා රේටයන් ඇතුළත් ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. එබැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මහාමාර්ග සම්මත රේටය (Highway Standard Rate) යොදා ගනිමින් කොන්ත්‍රාත්කරුවන්ගේ යෝජනා ඇගයීම් කර තිබුණි. කෙසේ වුවද, ප්‍රමාණ පත්‍රවල (BOQ) කොන්ත්‍රාත්කරුවන් විසින් යෝජනා කරන ලද රේටයන් ඉංජිනේරු රේටයන්ට සාපේක්ෂව ඉතා වැඩි වී තිබූ අතර කොන්ත්‍රාත්කරුගෙන් කොන්ත්‍රාත්කරුට රේටයන් වෙනස් වී තිබුණි.

(iii) 2012 වර්ෂයේ මුල් භාගයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඇස්ෆෝල්ට් අතුරන ලද මාර්ගයන්ගේ සමහර කොටස් දේශීය බැංකු මූල්‍යයන ව්‍යාපෘතිය යටතේ නැවත පුනරුත්ථාපනය කිරීම සඳහා ඇතුළත් කර තිබුණු බව අනාවරණය විය.

(iv) මාර්ග 28 ක් ඉදිකිරීම සඳහා මුළු ණය මුදලෙන් රු.මිලියන 55,392.2 ක් දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය වෙත ලැබී තිබුණි. එයින් රු.මිලියන 28,000 ක් ව්‍යාපෘති කටයුතුවලට සම්බන්ධයක් නොමැති අධිකාරියේ අනෙකුත් කටයුතු වෙනුවෙන් වැයකර තිබූ අතර රු.මිලියන 21,238.98 ක් අත්තිකාරම් සහ කළ වැඩ සඳහා ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ණය මුදලේ ඉතිරිය රු. මිලියන 6,153.34 ක් විය. කෙසේ වුවද කළ යුතු ඉතිරි වැඩ සඳහා ලබාගත් ණය මුදලෙන් ගෙවිය යුතු වටිනාකම රු.මිලියන 34,153.34 ක් විය. ඒ අනුව, කිරීමට නියමිත ඉතිරි මාර්ගවල වැඩ සඳහා ගෙවීම් කිරීමේදී නුදුරු අනාගතයේදී මූල්‍යමය අර්බුදයක් හට ගැනීමේ හැකියාවක් ඇති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර එය ඉදිකිරීම් වැඩ කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත.

(v) පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - නෝනාගම මාර්ග පුනරුත්ථාපනය කිරීමේ මාර්ග ව්‍යාපෘතියේ විෂය පථයට අදාළ නොමැති ව්‍යාපෘති කටයුතු වලින් බාහිර අතිරේක කාර්යයන් වූ ඇඹිලිපිටිය ජනාධිපති නිවාස ඉදිකිරීම සඳහා සහ අමතර මාර්ග 17 ක දුර කි.මී. 9.21 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 161.05 ක් ව්‍යාපෘතියේ මාර්ග පුනරුත්ථාපනය කිරීමට ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙතින් ලබාගත් රු.මිලියන 2,172 ක් වූ ණය මුදලින් වැයකර තිබුණි.

(vi) මාර්ග 08 ක් පිළිබඳව සිදුකළ නියැදි පරීක්ෂා කිරීම්වලට අනුව, මාර්ගවල දිග, පළල, කොන්ක්‍රීට් කාණු පද්ධති, බෝක්කු, පැති බැමි සහ මාර්ගයේ මතුපිට ස්ථරයේ ඉදිකිරීම් යනාදී කළයුතු වැඩ කොටස් අඩුකර රු.මිලියන 3,333 ක් වූ ඉතිරිවීම් ලබාගෙන තිබූ අතර එම ඉතිරිවීම් මුල් ව්‍යාපෘතියේ ලේඛනගත විෂය පථය පිළිබඳ සැළකිල්ලට නොගෙන වෙනත් ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කර තිබුණි. වෙනත් කටයුතු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ක්‍රියාකාරකම | වැයකල වටිනාකම |
|---|---|
| | රු. මිලියන |
| අනුමත මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති කටයුතු වලට පරිබාහිරව මාර්ග 59 ක ඉදිකිරීම් සඳහා | 943.54 |
| ව්‍යාපෘති වලින් පරිබාහිරව වෙනත් මාර්ග වල පාලම් ඉදිකිරීම් කටයුතු සඳහා | 65.86 |
| කෑගල්ල-ඩෝසන් බංගලාවේ ඉදිකිරීම්, පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලයේ ඉදිකිරීම් සහ වෙනත් මාර්ග ඉදිකිරීම් කටයුතු | 1,370.23 |
| වෙනත් පරිබාහිර මාර්ග 07 ක ඉදිකිරීම් කටයුතු සඳහා | 953.47 |
| **එකතුව** | **3,333.10** |

**(ඇ) නෝව්වුඩ් අප්කෝට් මාර්ගයේ පාලම ඉදිකිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නෝව්වුඩ් අප්කෝට් මාර්ගයේ අංක 9/12 පාලම ඉදිකිරීම සඳහා රු.3,456,682 ක පිරිවැයකට කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණි. පාලමේ පළල මීටර් 4 සිට මීටර් 7 දක්වා වැඩි කිරීම හේතුවෙන් නව කොන්ත්‍රාත් වටිනාකම රු.8,162,377 ක් දක්වා වැඩි වූ අතර අමතර වැඩ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. ඉදිකිරීම් වැඩ සඳහා රු.3,425,378 ක මුදලක් ලබා ගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරු විසින් පාලමේ ඉදිකිරීම් වැඩ නවතා දමා තිබුණි.

(ii) පාලමේ මතුපිට කොටසක පමණක් කොන්ක්‍රීට් තට්ටුව ඇතිරීම සිදුකර තිබුණු අතර අනතුරු ඇඟවීම් සංඥා සවිකර ඇතත් පාලමේ අනිත් කොටස අත් වැටවල් භාවිතයෙන් ප්‍රමාණවත්ව ආවරණය කර නොතිබූ බැවින් අනතුරු සඳහා විශාල අවදානමක් ඇති වී තිබුණි.

(iii) පාලම ඉදිකිරීම් 2010 ඔක්තෝබර් 26 දින ආරම්භ කිරීමටත්, 2011 මාර්තු 25 ට පෙර අවසන් කිරීමටත් යෝජනා කර තිබුණද, ඉදිකිරීම 2016 ජුනි 30 වන විටත් සම්පූර්ණ කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ඈ) විජේබාහුකන්ද පාලම ඉදිකිරීම**

(i) පාලම ඉදිකිරීම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 30.83 ක්ව තිබියදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 7.9.11 ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන් අනුගමනය නොකර ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 25.31 කින් අඩු වූ රු.මිලියන 23.90 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. පාලම ඉදිකිරීම් වැඩ 2012 ජනවාරි 09 ට පෙර නිම කිරීමට යෝජනා කර ඇතත් මාස 04 ක කාලය දීර්ඝ කිරීමකින් පසුව 2014 දෙසැම්බර් වන විටත් ඉදිකිරීම් වැඩ නිමකර නොතිබුණි. කෙසේ වුවද, ප්‍රමාද කාලය සඳහා ප්‍රමාද කළ අලාභ අය කිරීම සිදු කර නොතිබුණු අතර, අතිරේක වැඩ හේතුවෙන් රු.11,992,423 කින් හෝ සියයට 50 කින් කොන්ත්‍රාත් වටිනාකම වැඩි කර තිබුණි.

(ii) පාලම ඉදිකර තිබුණද පාලම භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සඳහා එයට ඇතුල්වන ස්ථානයේ පැති බැමි (wing walls), අත් වැටවල්, මතුපිට ස්ථරය සඳහා පෙරමුසු යෙදීම සහ ඇතුළු වන ස්ථානයේ සිට පාලම අතර බැක් ෆිලින්ග්ස් (Back Fillings) ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.2.2 ත්‍රිකුණාමලය පිටත වටරවුම් මාර්ගය නැවත ඉදිකිරීම.

මඩකලපුව - තිරික්කොන්ඩායි ආරු - ත්‍රිකුණාමලය (A-15) සහ අඹේපුස්ස - කුරුණෑගල - ත්‍රිකුණාමලය (A-6) මාර්ග, ත්‍රිකුණාමලය නගරයෙන් පිටත සම්බන්ධ වනසේ ඉදිකරන ලද පිටත වටරවුම් මාර්ගය සඳහා එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය යටතේ 2009 සහ 2010 වසරවලදී රු.මිලියන 3,495 ක් වැයකර පාලම් 08 ක් ඉදිකර තිබුණි. කෙසේ වුවද, 2016 මැයි 31 දින වන විට වසර 5 ක් ගත වී ඇතත් මාර්ගය ඉදිකිරීම සඳහා අරමුදල් නොමැතිවීම හේතුවෙන් මෙම පාලම් සම්බන්ධ කෙරෙන මාර්ග ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි.

### 4.2.3 කතරගම සංචාරක නිවාසය ඉදිකිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කතරගම සංචාරක බංගලාව ඉදිකිරීමේ කටයුතු පුද්ගලික සමාගමක් විසින් 2004 වර්ෂයේදී ආරම්භ කොට ඉදිකිරීමේ කටයුතු නිම කිරීමකින් තොරව අතරමග නවතා දමා තිබුණි. ඉන්පසු සෘජු කම්කරු ශ්‍රමය යොදා නැවතත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. පසුව කතරගම සංචාරක නිවාසයේ බිම් මහල ඉදිකිරීමේ වැඩ 2010 සැප්තැම්බර් 28 දින රු.12,352,242 කට කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණු අතර ඉදිකිරීම් කටයුතු සිදු කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.11,771,448 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු සමඟ එළඹි ගිවිසුම අනුව 2011 ජුනි 07 දිනට පෙර වැඩ නිම කල යුතුව තිබුණි. නමුත් 2015 දෙසැම්බර් 31 වන විටත් වැඩ නිම කර නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු විසින් බිම් මහලේ සිදුකරන ලද වැඩවල සැලකිය යුතු අඩුපාඩු තිබුණද, එම අඩුපාඩු පිළිබඳ සැලකීමෙන් තොරව පළමු මහලේ ඉදිකිරීමද 2014 දෙසැම්බර් 24 දින රු.7,922,316 කට මෙම කොන්ත්‍රාත්කරු වෙතම පවරා තිබුණි.

(iii) 2016 මැයි 31 දින විටද මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නියමිත පරිදි නිමකර සංචාරක නිවාසය භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 නිෂ්ඵල ගනුදෙනු

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2008 අගෝස්තු 20 දින නාගරික සංවර්ධන අධිකාරිය සමඟ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්සන් කරන ලද බදු ගිවිසුමේ විධිවිධානවලට අනුව ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩමක් සඳහා වාර්ෂික බදු කුලිය රු.මිලියන 6 ක් ලෙස තීරණය කර තිබුණි. කෙසේ වුවද, 2009 නොවැම්බර් 19 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය අනුව, මාසික බදු කුලිය රු. 1,000 ක් ලෙස සංශෝධනය කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි වාර්ෂික බදු කුලී ගෙවීම අඩු කිරීමට හැකිවන පරිදි බදු කුලී ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) විදේශ මූල්‍යායන ව්‍යාපෘතියක අරමුදල් යොදා ගනිමින් ඉදිකරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය 2014 නොවැම්බර් 21 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණද 2015 අප්‍රේල් වනතුරු ප්‍රධාන කාර්යාලය නව ගොඩනැගිල්ලට රැගෙන ගොස් නොතිබුණි. තවද, 2014 දෙසැම්බර් සිට 2015 අප්‍රේල් දක්වා රු.මිලියන 49.4 ක් වූ ගොඩනැගිලි කුලී නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි.

(iii) 2011 සිට 2015 දක්වා වර්ෂ තුළ ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 14,857.52 ක් වූ මාර්ග ව්‍යාපෘති 169 ක ඉදිකිරීම් වැඩ, අධිකාරියට අයත් නොවන මාර්ග ඉදිකිරීම්, අරමුදල් හිඟවීම ආදිය හේතුවෙන් අතරමඟ නවතා තිබුණි. 2015 දෙසැම්බර් 31 දක්වා ඒ වෙනුවෙන් වැය කළ වියදම රු. මිලියන 2,213.87 ක් විය. ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 7,293.38 ක් වූ මාර්ග පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ තවත් ව්‍යාපෘති 73 ක් 2015 වර්ෂය තුළ නැවත ආරම්භ කර තිබූ අතර නිමකර නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දක්වා වැය කළ මුළු පිරිවැය රු. මිලියන 1,689.63 ක් විය.

**4.4 වත්කම් කළමනාකරණය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වටිනාකම රු.32,139,477 ක් වූ උපයෝජනය නොකළ හා සෙමින් චලනය වන අමතර කොටස් තොගය 2012 වර්ෂයේ සිට භාවිතයට නොගෙන ගබඩාවේ රඳවා තිබුණි.

(ii) රු.4,746,349 ක් වූ යල් පැනගිය නිල ඇඳුම්, සපත්තු හා සැන්ඩල්ස්, ටයර් හා ද්‍රව්‍ය තොගය - ඇස්පෝල්ට් පිරියත අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව 2008 වර්ෂයේ සිට ගබඩාවේ රඳවා තිබුණි.

**4.5 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

ආශ්‍රිත සමාගම් සමඟ අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද සමහර ගණුදෙනු මතභේදාත්මක විය. එම ගණුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) **මග නැගුම සමාගම්වලින් ලැබිය යුතු මුදල්**

(i) 2012 පෙබරවාරි 10 දින මග නැගුම මාර්ග ඉදිකිරීම් සහ යන්ත්‍රෝපකරණ සමාගම සමඟ එළඹි ගිවිසුම් අනුව එම සමාගම සඳහා කුලියට දෙන ලද වාහනවල කුලී ප්‍රමාදයකින් තොරව අයකර ගත යුතු වුවද 2010 සිට 2014 කාලපරිච්ඡේදය සඳහා අධිකාරියට ලැබිය යුතු රු.333,200,550 ක කුලී 2015 දෙසැම්බර් 31 වන විට ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) වත්කම්, පාරිභෝගික ද්‍රව්‍ය හා අමතර කොටස් මිලදී ගැනීම සඳහා 2004 සිට 2007 දක්වා කාලපරිච්ඡේදය තුළ මග නැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගමට ලබාදුන් රු.63,276,545 ක් වූ අයවිය යුතු මුදල එම සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට අයකරගත යුතු රු. 10,923,083 ක් වූ වේතන සහ 2014 වර්ෂය තුළ සපයන ලද රු. 5,685,164 ක් වූ cold mix සම්බන්ධයෙන් මග නැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගම වෙත ගෙවීම් කිරීමට හෝ ලැබිය යුතු ශේෂවලට හිලව් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) අනුමත නොකරන ලද විචලතා නියෝග සහ වැඩ නියෝග

(i) අංක 2011 – 01 හා 2011 මාර්තු 28 දින දරන මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් / වැඩ බලන සභාපතිගේ චක්‍රලේඛය අනුව, විචලතා නියෝග නිකුත් කිරීමට සහ බාහිර සහ අතිරේක වැඩ සඳහා නියෝග කිරීමට අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගතයුතු වේ. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනට පහත අතිරේක වැඩ සඳහා එවැනි අනුමැතියන් ලබාගෙන නොතිබුණි.

| | අනුමැතිය සඳහා ඉදිරිපත් නොකරන ලද විචලතා නියෝගවල වටිනාකම | අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත විචලතා නියෝගවල වටිනාකම | එකතුව |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| කොන්ත්‍රාත් වටිනාකම තුළ නිකුත් කරන ලද විචලතා නියෝග. | 987.4 | 272.8 | 1,260.2 |
| කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා නිකුත් කරන ලද විචලතා නියෝග. | 384.7 | 42.3 | 427.0 |
| **එකතුව** | **1,372.1** | **315.1** | **1,687.2** |

(ii) අංක 2013 - 1 හා 2013 මාර්තු 19 දින දරන මාර්ග සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය අනුව, මග නැගුම මාර්ග ඉදිකිරීම සහ යන්ත්‍රෝපකරණ සමාගමට වැඩ නියෝග නිකුත් කිරීමට පෙර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වේ. කෙසේ වුවද, එම සමාගමට නිකුත් කරන ලද පහත වැඩ සඳහා පූර්ව අනුමැතියක් ලබා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

| | වැඩ නියෝගවල වටිනාකම | 2015 ජූලි දක්වා ගෙවූ වටිනාකම |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| 2013 වසරේ සිට නිකුත් කරන ලද වැඩ නියෝග | 17,093.4 | 2,898.7 |
| 2013 වසර දක්වා නිකුත් කරන ලද වැඩ නියෝග | 587.8 | 197.2 |
| **එකතුව** | **17,681.2** | **3,095.9** |

(iii) තවද, පූර්ව අනුමැතිය ලබා නොගෙන මග නැගුම මාර්ග ඉදිකිරීම් සහ යන්ත්‍රෝපකරණ සමාගමට නිකුත් කරන ලද වැඩ නියෝගවල වටිනාකම සහ මාර්ග පුළුල් කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන නිකුත් කරන ලද විචලතා නියෝගවල වටිනාකම රු.මිලියන 19,368.4 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට එයින් ගෙවූ අගය රු. මිලියන 3,281.9 ක් විය. ඒ අනුව නිමකළ වැඩවල වටිනාකම ගණනය කිරීමෙන් පසු 2015 දෙසැම්බර් 31 දිනට උපචිත බිල්පත්වල වටිනාකම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබූ අතර මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට ද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.6 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) සේවක සංඛ්‍යාව**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2015 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවක සංඛ්‍යා තත්ත්වය අනුව, තනතුරු 12 ක පුරප්පාඩු 710 ක් හා වෙනත් තනතුරු 08 ක අතිරික්ත 1080 ක් පැවති බව අනාවරණය විය.

(ii) ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවයේ පුරප්පාඩු 06 ක්, තාක්ෂණික සේවයේ පුරප්පාඩු 144 ක් සහ ලිපිකරු හා සමාන්තර සේවාවල පුරප්පාඩු 28 ක් විගණනයේදී නිරීක්ෂණය විය. මෙම තත්ත්වය අධිකාරියේ කාර්යසාධනය කෙරෙහි අහිතකරව බලපා ඇති බව නිරීක්ෂණය විය.

(iii) අත්‍යවශ්‍ය තනතුරු සඳහා සුදුසුකම්ලත් නිලධාරීන්ගේ හිඟයක් සහිතව අධිකාරියේ පාලම් සැලසුම් අංශය ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය විය. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කළමනාකාර තනතුරු 07 ක පුරප්පාඩු පැවතුණි.

**(ආ) වෙනත් ආයතන සඳහා ලබාදුන් අධිකාරියේ සම්පත්**

**-----------------------------------------------------------**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 8.3.9 වගන්තිය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් කිසිදු රාජ්‍ය ආයතනයක් වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසායයක් විසින් වියදම් දැරීම හෝ එහි සම්පත් යෙදවීම (මානව සම්පත් ඇතුළත්ව) සඳහා අවසර ලබා දී නොමැත. කෙසේ වුවද මෙයට පටහැනිව අධිකාරිය විසින් එහි කාර්ය මණ්ඩලයේ 260 දෙනෙකු උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර පසුව එම සේවකයන් සමාලෝචිත වර්ෂය තුළදී නැවත මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්ත කර තිබුණි.

**(ඇ) ප්‍රසම්පාදන අංශයේ කාර්යසාධනය**

**-----------------------------------------**

(i) මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදනයන් විධිමත් හා කාර්යක්ෂම ආකාරයෙන් සිදු කිරීමේ අරමුණ සහිතව ප්‍රසම්පාදන අංශය පිහිටුවා තිබුණි. කෙසේ වුවද, මෙම අංශයේ කාර්යයන් පිළිබඳ දුර්වල පාලනය හේතුවෙන් එහි අපේක්ෂිත කාර්යසාධනය සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

(ii) එම අංශයේ අනුමත සේවක සංඛ්‍යාව 36 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 15 ක් විය. තවද ප්‍රධාන ඉංජිනේරු, තවත් ඉංජිනේරුවරයන් 03 දෙනෙකු සහ තාක්ෂණික නිළධාරියෙකු වැනි අත්‍යවශ්‍ය තනතුරු සඳහා 2014 වර්ෂයේ සිට පුරප්පාඩු පැවතුණි.

(iii) රු.මිලියන 31.32 ක් වූ ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදනයන් පමණක් ප්‍රසම්පාදන අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණි. වෙනත් ප්‍රසම්පාදනයන්, ප්‍රසම්පාදන අංශයේ සේවය ලබා නොගෙන අදාළ වෙනත් අංශ මඟින් සිදුකර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**-----------------------------------------**

### 5.1 සංයුක්ත සැලැස්ම

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති "යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මාර්ගෝපදේශ" අංක: පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 5.1.3 ඡේදයට අනුව, සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන කරන ලද පිටපත් එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 ට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද 2014 – 2018 දක්වා කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ මාස 12 ක ප්‍රමාදයකින් පසු එනම් 2015 ජනවාරි 01 දිනදීය.

තවද, සංයුක්ත සැලැස්ම කාලීනව සමාලෝචනය කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. 2015 – 2019 දක්වා කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ මාස 12 ක ප්‍රමාදයකින් පසු 2016 ජනවාරි 04 දින වන අතර 2016 - 2020 දක්වා කාලපච්ඡේදයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ සංයුක්ත සැලැස්ම මාස 02 ක ප්‍රමාදයක් සහිතව 2016 පෙබරවාරි 29 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛය අනුව, එක් එක් අංශයේ මානව සම්පත් අවශ්‍යතාවයන් සංයුක්ත සැලැස්මේ අන්තර්ගත කළයුතු වේ. කෙසේ වුවද, තථ්‍ය අවශ්‍යතාවන් ඇගයීමකට ලක්කර මානව සම්පත් අවශ්‍යතාවන් පිළිබඳ විස්තර සංයුක්ත සැලැස්මට අන්තර්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

2015 මුදල් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පිළියෙල කරන ලද කාර්යසාධන වාර්තාව අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, වාර්ෂික කාර්යසාධන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය අධිකාරිය විසින් අනුගමනය කර නොතිබුණි.

**5.3 අයවැය පාලනය**

2015 වර්ෂය සඳහා අයවැය ලේඛනය අවස්ථා 02 දී සංශෝධනය කර තිබුණු අතර අවසාන සංශෝධිත අයවැය ලේඛනය සඳහා 2015 දෙසැම්බර් 21 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණි. සුදුසු සහ ඵලදායී අයවැය පාලන ක්‍රමයක් නොමැති වීම හේතුවෙන් අධිකාරියේ සංශෝධිත අයවැය සහ තථ්‍ය ආදායම සහ වියදම අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. එම නිසා කළමනාකරණ පාලනයන් සඳහා ඵලදායී උපකරණයක් ලෙස අයවැය ලේඛනය උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6 පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | විගණන නිරීක්ෂණයන් |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම, වගකීම් වර්ගීකරණය (ජංගම හා ජංගම නොවන) සහ උපචිත වියදම් ගිණුම්ගතකරණය. |
| | | (ii) සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගණුදෙනු හෙළිදරව් කිරීම. (මගනැගුම සමාගම් සහ එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් සමාගම සමඟ ගණුදෙනු). |
| | | (iii) වත්කම් පැවරීම සහ අපහරණය කිරීම සම්බන්ධයෙන් ගිණුම්කරණ පිළියම් සහ ලෙජර් ගිණුම් සඳහා විස්තරාත්මක උපලේඛන පිළියෙල කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) | අදහස් කරනු ලැබූ අරමුණු සඳහා ඵලදායී අරමුදල් උපයෝජනය, මූල්‍ය යෝජනා ඇගයීම, වැඩ නියෝග සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම, වැඩ සටහනට අනුව ඉදිකිරීම් වැඩ නිම කිරීම. |
| | | (ii) | අදහස් කරනු ලැබූ අරමුණු සඳහා අරමුදල් උපයෝජනය. |
| (ඇ) | ඉන්වෙන්ට්‍රි පාලනය | | යල්පැනගිය ඉන්වෙන්ට්‍රි අයිතමයන් අපහරණය. |
| (ඈ) | වත්කම් කළමනාකරණය | | ඉඩම් උපයෝජනය. |